දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.


මගේ අංකය / எமது இல. / My No. ඊඩී1/15/2/3/5

දිනය / திகதி / Date 2009-06-30

චක්‍රලේඛ අංක : 2009/20

සියළුම පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

**<u>බාහිර පුද්ගලයන් ක්‍රීඩා පුහුණුකරුවන් වශයෙන් පාසල් වල සේවයට යෙදවීම</u>**

බාහිර පුද්ගලයින් ක්‍රීඩා පුහුණුකරුවන් වශයෙන් සේවයේ යෙදවීමේදී ඔවුන්ට දරුවන් සමග කටයුතු කිරීමට ඉඩ සැලසීම මගින් දරුවන් ලිංගික අපයෝජනයන්ට ලක්වීම හෝ දැඩි කායික හා මානසික හිංසනයන්ට ලක්වන සිද්ධීන් වාර්තාවී ඇති බව ජාතික ළමා ආරක්ෂන අධිකාරිය විසින් මා වෙත දන්වා එවා ඇත. එම නිසා බාහිර පුද්ගලයින් ක්‍රීඩා පුහුණු කටයුතු වල යෙදීමේදී පහත පරිදි කටයුතු කළ යුතු බව දන්වමි.

02. මෙම පුහුණුකරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගත යුතුය. එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පහත සඳහන් පුද්ගලයන් ඇතුලත්විය යුතුය.

- I. අදාල විදුහලේ විදුහල්පති
- II. අදාල කලාපයේ ක්‍රීඩා පිළිබඳ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
- III. විදුහලේ ක්‍රීඩාභාර ආචාර්යවරයා

උක්ත අංක I හා II හි නම සඳහන් නිළධාරීන් දෙදෙනාගෙන් ජ්‍යෙෂ්ඨත්වයෙන් වැඩි නිළධාරියා මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස පත් කළ යුතුය.

03 අයදුම්කරුවන්ගෙන් පහත සඳහන් සහතික ගෙන්වා පරීක්ෂා කල යුතුය.

1. ග්‍රාමසේවා සහතිකයක් (ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද )
2. පදිංචි ප්‍රදේශයේ පොලිස් ස්ථානයෙන් ලබා ගන්නා ලද පොලිස් වාර්තාවක්,
3. අදාල ක්‍රීඩාව පිළිබඳ ඔහුගේ ප්‍රවීනත්වය තහවුරු කරන සහතික
4. අදාල පුහුණුකරු වෙනත් පාසලක/පාසල් කීපයක දැනට පුහුණුකරුවෙකු ලෙස සේවය කරන්නේ නම් හෝ සේවය කර ඇත්නම් එම පාසල් වල විදුහල්පතිවරුන්ගෙන් නිර්දේශය සහිත ලිපි.
5. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට අවශ්‍යයැයි හැගෙන අනෙකුත් ලියවිලි

ඉහත දැක්වෙන පරිදි කටයුතු කර සුදුස්සන් තෝරා මාස 6 ක කාලයකට සේවයේ යොදවා සතුටුදායක සේවාවක් ඉටු කරන්නේ නම්, මාස හයෙන් හයට සේවය දීර්ඝ කල යුතු බව කාරුණිකව සලකන්න.

එම්.එම්.එන්.ඩී.බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්,

1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
2. කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
3. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.